# සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල භාවිතා කරමින් ක්‍රියාත්මක විශේෂ නිවාස වැඩසටහන

## රෙගුලාසි මාලාව

## 2026.02.01


**සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල**

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

**සමාජ සංවර්ධන අංශය**

4 මහල, සෙත්සිරිපාය

**බත්තරමුල්ල.**

# දර්ශනය

## නිවාස සිහිනය සැබෑ කර ගැනීමට වෙර දරන දිරිය මිනිසුන් උදෙසා ස්ථිර නිවසක්

# මෙහෙවර

**කුඩා ව්‍යවසායක පවුල්, නිවාස නොමැති පවුල් හා ආර්ථික මට්ටමින් ජීවයක් නොලත් පවුල් තුළ නිවසක් සාදා ගැනීමට අත්වැලක් සැපයීම තුළින් ඔවුන්ගේ ආර්ථික, සමාජීය, අධ්‍යාපනික හා සංස්කෘතිකමය වශයෙන් ජීවිතය ජය ගැනීමට වෙර දරන මිනිසුන්ට ශක්තියක් ලබාදීම තුළින් අධ්‍යාත්මික ගුණවගාවන් සංවර්ධනය කිරීම**

# ඉලක්ක

**01.** නිවසක් නොමැති කුඩා ව්‍යවසායකයින් හා ජීවිතය ජය ගැනීමට වෙර දරන අඩු ආදායම්ලාභී ප්‍රතිලාභීන්ට සවියක් වීම

**02.** ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරා ගන්නා ලද ආර්ථික දුබලතාවයෙන් යුත් පවුල් සඳහා ස්ථිර නිවාස ප්‍රශ්නයට තිරසාර විසඳුමක් ලබාදීම

**03.** වාර්ෂිකව ලබාදෙන නිවාස ඉලක්කය සපුරාලමින් නිවාස ලොතරැයි අරමුදලේ පරමාර්ථ ඉටුවන ආකාරයට යොදා ගැනීම හා දේශීය මුදල් වෙළඳපලේ වඩාත් ඵලදායී ලෙස

ආයෝජනය තුළින් ලැබෙන ආදායම යලිත් මෙම අරමුදලේ කාර්යයන් ඉටුවන ආකාරයට යොදා ගැනීම

# පරමාර්ථ

01. අඩු ආදායම්ලාභී හා සුළු ව්‍යාපාරික පවුල්වල සුභසාධනය වැඩි කිරීම සඳහා ඔවුන්ගේ තාවකාලික නිවාස ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමක් ලබාදීම

**02.** රජය මගින් එක් එක් කාල වකවානුවල ඉදිරිපත් කරනු ලබන රාජ්‍යතාන්ත්‍රික විශේෂ වැඩසටහන් තුළට අයත් වන පවුල් තෝරා ගනිමින් එම පවුල් ශක්තිමත් කිරීම සහ ඔවුන්ගේ අධ්‍යාත්මික ගුණ වගාවන් දියුණු කිරීම

**03.** මෙම වැඩසටහන කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීම වෙනුවෙන් කටයුතු සම්පාදනය කිරීම හා අවශ්‍ය ප්‍රතිපාදන දැරීම

**04.** අරමුදල මගින් කරනු ලබන විශේෂ සේවාවලදී ඒ වෙනුවෙන් දායකත්වය දැරීම

2013 අංක 01 දරණ දිවි නැගුම පනතේ 45 වැනි වගන්තිය මගින් සලසා ඇති කරුණු අනුව 1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරි පනත යටතේ ක්‍රියාත්මක කරන ලද නිවාස අරමුදල යටතේ විශේෂ නිවාස වැඩසටහන ක්‍රියාත්මක කළයුතු වන්නේය.

01. මෙම වැඩසටහන "විශේෂ නිවාස වැඩසටහන" නමින් මින් මත්තට භාවිතා කරනු ලැබිය යුතු වන්නේය.

02. දැනට පවත්වාගෙන යනු ලබන නිවාස සංවර්ධන අරමුදල එසේම පවත්වාගෙන යායුතු වන්නේය.

03. 2013 අංක 01 දරණ සමෘද්ධි පනතේ 45 වගන්තියේ සඳහන් පරිදි සමෘද්ධි විශේෂ නිවාස ලබාදීම නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලයේ පූර්ණ අධීක්ෂණය යටතේ සිදු කළයුතු වන්නේය.

04. නිවාස සංවර්ධන භාරකාර අරමුදල් මණ්ඩලයේ තීරණය හා අනුමැතියට යටත්ව වාර්ෂිකව පවතින මුදල් සීමාවට අනුගතව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් නිවාස ලබාදීම සිදු කළ යුතු වන්නේය .

05. ඉදිරියේදී කුඩා ව්‍යවසායකයින්, අඩු ආදායම්ලාභීන් හා රජය විසින් නම් කරන ලද විශේෂ වැඩසටහන් වලට අයත් ප්‍රතිලාභීන් හා විශේෂ අවශ්‍යතා ඇති ප්‍රතිලාභීන්ට (අත්‍යාවශ්‍ය, අභියාචනා) මෙම නිවාස ලබාදීම ක්‍රියාත්මක කරනු ඇත.

06. සෑම නිවාසලාභියෙකුම නිවාස යෝජනාව ලබාදීමේදී ඒ සඳහා ඉල්ලීම් ලිපියක් හා දැනට පදිංචි නිවසේ ඡායාරූපයක් ඉදිරිපත් කළ යුතුය. තවද නිවසක් නොමැතිව කුළියට පදිංචි වී සිටින පුද්ගලයින් ඒ පිළිබඳව ග්‍රාම නිළධාරී මගින් සහතිකයක් ඉදිරිපත් කළයුතු වන්නේය.

07. අවම වශයෙන් පවුලේ සංඛ්‍යාව තිදෙනෙකුවත් සිටිය යුතු අතර (වැන්දඹු, ආබාධිත) විශේෂ අවශ්‍යතා පිළිබඳ සලකා බැලීම සුදුසු වේ.

08. විශේෂ නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී එක් එක් අවුරුදුවල ගනු ලබන තීරණ අනුව නිවාස සඳහා ලබාදෙන මුදල් දීමනා විවිධ අගයන් ගනී. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරා ගැනීමෙන් අනතුරුව ප්‍රතිලාභීන්ගේ තොරතුරු වශයෙන් දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, නම, ලිපිනය, පවුලේ තොරතුරු නිවැරදි ආකාරයට නිවාස තොරතුරු අයදුම්පතට අනුව ඉදිරිපත් කළ යුතුය.

09. සෑම වසරකම නිවැරදිව තෝරා ගනු ලබන නිවාස යෝජනා නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලයේ අනුමත වූ පසු ඒ පිළිබඳ ලේඛනය දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත ප්‍රධාන කාර්යාලය මගින් ලබාදිය යුතුය.

10. ආරක්ෂක අංශවල සේවයේ නියුතු හෝ විදේශ ගතවී සිටින, රජයේ රැකියා කරනු ලබන පවුල් සඳහා කිසිදු ආකාරයකින් නිවාස ලබාදීම සඳහා දායක කර නොගත යුතුය.

11. මෙම නිවාස ඉදිකිරීමේදී වසමභාර සමෘද්ධි සංවර්ධන නිළධාරී හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සමාජ සංවර්ධන නිළධාරීන්ගේ ප්‍රධාන රාජකාරී වගකීමක් ලෙස කටයුතු කළ යුතුය.

12. ප්‍රධාන කාර්යාලයෙන් දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත ලබාදෙනු ලබන නිවාස ආධාර මුදල් ඔවුගේ පූර්ණ අධීක්ෂණය යටතේ ප්‍රාදේශීය ලේකම් වෙත නිදහස් කළ යුතුය.

13. නිවාස ප්‍රතිලාභීන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගැනීමෙන් අනතුරුව අදාළ වර්ෂයේදී නිකුත් කරනු ලබන චක්‍රලේඛන උපදෙස් පරිදි අදියර මට්ටමින් අදාළ මුදල් ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රතිලාභීන් වෙත නිදහස් කළ යුතුය.

14. සෑම නිවාස ඉදිකිරීමක්ම අනුමත කළදින සිට වසරක් තුළ අවසන් කිරීමට කටයුතු කළයුතුය.

15. අඩුම වශයෙන් නිවාස ඉදිකිරීමේදී එහි එක් අවස්ථාවක් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කරනු ලබන කාර්මික නිළධාරිගේ අධීක්ෂණයට ලක්විය යුතුය.

16. අත්‍යාවශ්‍ය අවස්ථාවක් හඳුනාගතහොත් පමණක් නිවාස සංශෝධනය සිදු කරන අතර අනෙක් කිසිදු අවස්ථාවක නිවාස සංශෝධන සිදු නොකිරීමට කටයුතු කළ යුතුය. එසේ සංශෝධනයක් සිදු වන්නේ නම් සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කර නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය.

17. භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත අවශ්‍ය අවස්ථාවලදී පමණක් දිස්ත්‍රික් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවශ්‍යතාවය අනුව ඉන්ධන, ලිපිද්‍රව්‍ය හා ගමන් වියදම් වෙනුවෙන් දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට නියමිත නිවාස සඳහා වෙන්වන මුදලින් 1% පමණ ප්‍රමාණයක් පරිපාලන වියදමක් ලෙස දැරිය හැකිය.

18. එහිදී පරිපාලන වියදම් ලෙස අදාළ මුදල ප්‍රධාන කාර්යාලයෙන් වෙනමම ලබාදෙන අතර 0.25%ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහාත් 0.75%ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහාද වැය දැරීම සිදු කළ හැකිය.

19. නිවාස වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී දිස්ත්‍රික් මට්ටමින් නිවාස යෝජනා ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වුවහොත් ඒ වෙනුවෙන් වෙන් කරන ලද මුදල් ප්‍රධාන කාර්යාලයේ නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල් ගිණුමට බැර කළ යුතුය.

20. සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි අරමුදල් ගිණුම මාසිකව පවත්වා ගනිමින් නියමිත කාල වකවානුවලට අරමුදලේ වර්ධනය උදෙසා සුදුසු පරිදි ආයෝජනය කරමින් අරමුදලේ පැවැත්ම තහවුරු කර ගැනීම ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශයේ ප්‍රධාන ගණකාධිකාරී විසින් කළ යුතුය.

21. සමෘද්ධි නිවාස සංවර්ධන අරමුදලට බැරවන මුදල් මෙම අරමුදලේ පරිපාලන හා සංවර්ධන වියදම් සඳහා ද ඉතිරි මුදල්වේනම් ඒවා අරමුදලේ පරමාර්ථ ඉටුකර ගැනිම සඳහා ද, අරමුදල් වර්ධනය කර ගැනීම සඳහා ආයෝජනය කිරිම සඳහා ද, යොදාගත හැකිවන්නේය.

22. මෙම අරමුදල පාලනය කිරිම සමෘද්ධි නිවාස සංවර්ධන අරමුදල් භාරකාර මණ්ඩලය විසින් කළයුතු වන්නේය. මෙහි සංයුතිය 2002 ජුනි මස 06 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ ඇ වගන්තියේ සඳහන් පරිදි මෙම භාරකාර මණ්ඩලයේ සභාපති වශයෙන් සමෘද්ධි විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා ද සෙසු සාමාජිකයන් වශයෙන් ,

- සමෘද්ධි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාද ,
- මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ද,
- සමෘද්ධි දෙපාර්තමේන්තුවේ සුභසාධන (සහනාධාර) අංශයේ අධ්‍යක්ෂවරයාද,
- සමෘද්ධි විෂය භාර අමාත්‍යාංශයේ නම් කළ තවත් එක් නියෝජිතයෙක් ද පත් කළයුතු වන්නේය.

2005 පෙබරවාරි මස 10 වන දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව,

- සමස්ථ ලංකා සමෘද්ධි කළමනාකරුවන්ගේ සංගමයේ නියෝජිතයෙක්ද,

- සමස්ථ ලංකා සමෘද්ධි සංවර්ධන හා කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිළධාරී සංගමයේ නියෝජිතයෙක්ද පත්කළ යුතු වන්නේය.

තවද දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු ඉටු කිරීම වෙනුවෙන් නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලයට පහත සඳහන් නිළධාරීන්ද ඇතුළත් කර ඇත.

- ප්‍රධාන ගණකාධිකාරී
- විෂයය කටයුතුභාර අංශයේ අධ්‍යක්ෂවරයා
- විෂයයභාර කළමනාකරු(නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලයේ ලේකම්)

23. සමෘද්ධි නිවාස සංවර්ධන අරමුදල් භාරකාර මණ්ඩලය විසින් අරමුදලේ සියළුම ලැබීම් හා ගෙවීම් පිළිබඳ තිරණ ගනු ලබන අතර, එකී අරමුදල සංවර්ධනය කිරීම සඳහා වූ සියළු තිරණ හා පියවර එකී භාරකාර මණ්ඩලය විසින් කලින් කලට තිරණය කළ යුතු අතර, එකී භාරකාර මණ්ඩලයට හැගෙන මෙම අරමුදලේ පරමාර්ථ වලට අනුකූල වන්නා වූ ව්‍යාපෘති එකී අරමුදලේ මූල්‍ය හා නෛතික ප්‍රතිපාදන භාවිතා කොට සිදු කළ හැකිවන්නේය.

24. එසේම මින් ඉදිරියට සමෘද්ධි නිවාස වැඩසටහන පවත්වාගෙන යාම සඳහා වූ ඍජු පරිපාලන වියදම් ලොතරැයි භාරකාර මණ්ඩලය තීරණය කරනු ලබන ප්‍රමාණයක් ඉහත අරමුදලින් වැය කිරිමට බලය ඇත්තේය.

25. මෙම අරමුදල පවත්වාගෙන යාමේදී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය වාර්ථාව සකස් කර නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය.

26. සමෘද්ධි නිවාස ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහන සඳහා අංක අමප/02/0403/137/001 දරණ 2001.06.12 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය යටතේ ඉදිරිපත් කරන ලද ඒ සඳහා වරින් වර එක් කරන ලද සංශෝධන ඇතුළත් රෙගුලාසි මාලාව සඳහා 2025.12.31 දිනෙන් අවලංගු වන අතර විශේෂ නිවාස වැඩසටහන සඳහා අදාළ නීතිරිති ඇතුළත් මෙම රෙගුලාසි මාලාව 2026.02.01 සිට බල පැවැත්වෙන්නේය.

27. නිවාස ලොතරැයි භාරකාර මණ්ඩලයේ සාමාජිකයින් සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ උපදෙස් වලට අනුව දීමනා ගෙවීමට බලය ඇත්තේය.

28. භාරකාර මණ්ඩලයට අවශ්‍ය පරිදි කලින් කලට ඉහත සඳහන් රෙගුලාසි සංශෝධනය කිරිමට හෝ නව රෙගුලාසි පැනවිමට හෝ එම භාරකාර මණ්ඩලයට බලය ඇත්තේය.